


(1) "ඩඩා විවටි ආ යු ඩුයින්. (***Dady- what are you doing***) කුඩා සෙතිඳුතම පියාගෙන් ඇසීය. "අයෑම් දර පලනවා. දර පලමින් සිටි ප්‍රසන්න කීය. "විවටි දර ප්පලනවා විවටි ඉස් දැටි" සෙතිඳු යළිත් ඇසීය. වයස අවුරුදු දෙක හමාරක් පමණ වූ මේ දරුවාගේ කතාබහ අමුතුය. ඔහු වැඩිපුර කතා කරන්නේ ඉංග්‍රීසි. උච්චාරණය බටහිර ජාතිකයකු මෙනි. සෙතිඳු තම පියා සමඟ සුපිරි වෙළෙඳ සැලකට ගිය අවස්ථාවක එහි සිටි සුදු ජාතිකයකු සෙතිඳුගේ නෙත ගැටිණ. වහා ඔහු වෙත දිව ගිය සෙතිඳු ඔහු හා කතාවට වැටුණේ කලක් දන්නා හඳුනන අයකු මෙන්ය. ඔහු කැනඩා ජාතිකයෙකි. කැනඩාවේ
ඇති එක්තරා දුම්රිය ඇංජින් නිෂ්පාදන ආයතනයක විස්තර කැනඩා ජාතිකයා සමඟ කතා කළේ එම ආයතනයේ වැඩ කරන ලද අයෙකු මෙනි. අවසානයේ කැනඩා ජාතිකයා සෙතිඳුගේ පියාගෙන් විමසුවේ ඔබ කැනඩාවේ පදිංචි ශ්‍රී ලාංකිකයෙක් ද යන්නය. මේ දරුවාගේ හා කැනඩාවේ දරුවකුගේ කතා විලාසයේ වෙනසක් නැති බව හෙතෙම ප්‍රකාශ කර සිටියේය. සෙතිඳුගේ පවුලේ කිසිවෙක් ඉංග්‍රීසි භාෂාව භාවිතා කරන්නේ නැත. සෙතිඳු ඉතා කැමැති බටහිර රටවල නව නිපැයුම් ගැන අධ්‍යයනය කරන්නටය. දැන් සෙතිඳුගේ වයස අවුරුදු පහකි. සෙතිඳුට අවශ්‍ය සංගත තැටි පියා විසින් අවශ්‍ය පරිදි ගෙනැවිත් දෙන්නේය.

(2) මාතර රාහුල විද්‍යාලයේ 7/8/9 ශ්‍රේණිවල අධ්‍යාපන චාරිකාව අනුරාධපුරය මිහින්තලය කලාවැව ආදී පෙදෙස්වල පුරාවිද්‍යා ස්ථාන නැරඹීම සඳහා විය. දිවා ආහාරය ගැනීම සඳහා අනුරාධපුරයට කිට්ටුව එක්තරා නිස්කලංක ප්‍රදේශයක දොළ පාරක් අයිනේ බස් රථය නැවැත්වීය. අප එකල අට වන ශ්‍රේණියේ ඉගෙනමු ලබන අය වීමු. ප්‍රදේශය ටිකක් විපරම් කළ රන්සිරි තමා මීට පෙර මෙහි පැමිණ ඇති බව කීවේය. රන්සිරි ගේ පියා ද මේ ගමනට එක් වී සිටි හෙයින් අප ඔහුගෙන් ඒ ගැන විමසුව විට "මොන පිස්සු ද පුතේ රන්සිරි තියා මමත් මේ පැත්තේ එන පළවෙනි වතාවී යැයි කීවේය. දොළ පාරේ ටිකක් ඉහළට ගිය විට ඇනිකට් එකක් (කුඩා දොළ පාරවලින් කුඹුරුවලට වතුර හැරවීමට උපයෝගී කර ගන්නා තැන) ඇති බවත් ඒ සමගම වමට පාරක් ඇති බවත් ඔහු කීවේය. අප මුල් ගුරු මහතාගේ අවසරය පිට සැතපුම් කාලක් (මීටර් හාරසීයක්) පමණ ඒ දෙසට ඇවිද ගියෙමු. රන්සිරි කිවූ වමට පාර හා ඇනිකට් එක අපට දකින්නට ලැබුණි. එතැන් සිට තවත් යාර පනහක් ගිය තැන කිරි බණ්ඩියාගේ ගෙදර ඇති බව රන්සිරි කීවේය. අප එය බැලීමට ද ගියෙමු. එහෙත් එතැන එවන් ගෙයක් නොතිබිණ. රන්සිරිට විහිළු කරමින් අපි ආපසු පැමිණ මුල් ගුරු මහතාට මේ ගැන කීවෙමු. එතුමාට මේ ගැන හොයන්නට අවශ්‍ය විය. අප නැවතත් එම ස්ථානවලට ගියෙමු. කිරි බණ්ඩියාගේ නිවස තිබුණා යැයි කිවූ තැන මුල් ගුරු මහතාගේ දැඩි සෝදිසියට ලක් විය. එතැන රූස්ස ගස් වැවී තිබිණ. ඉතා පරීක්ෂාකාරීව එම ස්ථානය දෙස බැලූ මුල් ගුරුතුමා මේ ස්ථානයේ වසර සියයකට පමණ පෙර නිවසක් තිබී ඇති බව කීවේය. ඒ ප්‍රදේශයේ තරුණයන් කිහිප දෙනෙක්ම හමු වුණ නමුත් ඒ කිසිවෙකුත් ඒ ගැන දැන නොසිටියහ. වයස අවුරුදු අනූවක් පමණ වන වැඩිහිටියකු පාරේ යනු දුටු මුල් ගුරුතුමා ඔහුගෙන් කිරි බණ්ඩියා නමැති අයකුගේ ගෙයක් මෙම ස්ථානයේ තිබුණේ දැයි විමසීය. "ඔව් කිරි බණ්ඩිය ආතගේ ගෙදර මෙතන තමා තිබුණේ. ආතා මැරෙන කොටත් අපි පොඩි ළමයි. එයාගේ ළමයි ඔය ඈත පළාත්වල පදිංචියට ගිය නිසා එයාගේ කටු මැටි ගෙය කැලේටම සින්න වුණා. එම වැඩිහිටි තැනැත්තා කීවේය. රන්සිරි ඒ ප්‍රදේශය ගැන කිවූ බොහොමයක් කරුණු එම වැඩිහිටියා කිවූ කරුණු සමඟ ගැලපිණ. ගමන ගොස් එන තෙක්ම රන්සිරිගේ මෙම විශේෂත්වය ගැන සියලූ දෙනාම කතාබහ කරන්නට විය. කෙසේ වෙතත් අවසානයේ රන්සිරිට කිරි බණ්ඩියා යැයි නමක් ද පට බැඳිණි.

අගෝස්තු නිවාඩුවේ එක් දිනෙක මට රන්සිරිගේ නිවසට යන්නට ලැබුණේ එවකට මගේ වැඩිමහල් සහෝදරයා ප්‍රදේශයේ ගුරුවරයකු වශයෙන් රැකියාව කළ හෙයිනි.
මා උදේ සිට සන්ධ්‍යාව තෙක් රන්සිරිගේ නිවසේ සිටිය අතර රන්සිරිගේ පියාගේ පියා ,සීයා මුණගැසීමට මට ඉඩකඩ ලැබිණි. සීයාගේ අබලන් වූ විදුලි පන්දම අලූත්වැඩියා කර දීමෙන් අනතුරුව හේ මා සමඟ බෙහෙවින් කුළුපග විය. ඔහුගේ අතීත තොරතුරු විමසීමේදී සීයාගේ සීයා ජීවත්ව ඇත්තේ එදා රන්සිරි විනෝද ගමනේදී විස්තර කළ ගම් ප්‍රදේශයේ බව අනාවරණය විය. කොත්තං නමැති එම සීයා විවාහ වී ඇඹිලිපිටිය ප්‍රදේශයට පැමිණි බවත් එතැන් සිට ඔහුගේ පරම්පරාව මෙහි ජීවත්වන බවත් සීයාගෙන් දැනගන්නට ලැබිණ. ඊට වඩා වැඩි විස්තරයක් හෝ කිරි බණ්ඩියා ගැන හෝ මේ සීයා දැන සිටියේ නැත.

(3) "මට උඹේ පොත් ඕනෙ නැහැ. මම චින්තට දීපු පොත් ඕන තරම් තියෙනවා. මං ඒවා ඉල්ලගෙන එනවා. කුඩා භාග්‍යා තම වැඩිමල් සොහොයුරාත් සමඟ පොතක් සඳහා රණ්ඩු වෙන ගමන් කීවාය. නොයෙක් වේලාවන්හිදී නුහුරු දේවල් පවසන ඇය ගැන දෙමාපියන් සිටියේ දැඩි සෝදිසියෙනි.

හදිසියේම ඒකනායක නිවසට අමුත්තියක් පැමිණියාය. අම්මා සමඟ පැමිණි ඇය කිසිදු චකිතයකින් තොරව ඒකනායක නිවසේ කාමරයකට ගියාය. "මේ කාමරේ ඔක්කොම විනාශ කරලා දාලා පොත් පත් ඇදලා දාලා අයියෝ මොනවද මේ කරලා තියෙන්නේ භාග්‍යා නමැති මෙම අමුත්තියගේ කෑගැසීමට ඒකනායක මහත්මිය කුස්සියේ සිට පැමිණියාය. ඇගේ මුහුණ දෙස බලා සිටි මේ කුඩා දැරිය "අනේ අම්ම වයසට ගිහිල්ල ගොඩක්" යැයි කියමින් ඇයව බදා ගත්තාය. ඒකනායක මහත්මියගේ නෙතින් වැටුණු කඳුළු බිඳුවක් පොළොව සිප ගත්තේය. "මේ ළමයා මේ පාරක තියෙන ගෙයක් ගැන හැම තිස්සෙම කියවනවා. අපි මේ වීල් එකක් අරන් හොයාගෙන ආව" දැරියගේ මව කීවාය.

ඒකනායක පවුලේ දියණිය වන චම්පිකා මෙයට වසර හයකට පෙර වකුගඩු රෝගයක් හේතුවෙන් මිය ගියාය. නැවත ඉපදුණු චම්පිකා මේ දැරිය බව ඒකනායක මහත්මියට තේරුම් ගියේ මෙම කුඩා දැරිය කතාබහ කරන ඇවිදින ආකාරය චම්පිකාගේ ඉරියව්වලට ඉතා සමීප නිසාය. "අම්මා කෝ ලොකු මල්ලි" භාග්‍යා ඒකනායක මහත්මියගෙන් විචාළේය. "මල්ලි ගමනක් ගිහිල්ලනෙ පුතේ" මියගිය චම්පිකා, ජයධම්මික ඇමතුවේ ලොකු මල්ලි යනුවෙනි. "නංගි මේ පැත්තෙ ඉන්නවද චින්ත කියලා දරුවෙක්, අනේ මේ අපේ දරුවා හැම තිස්සේම කියවනවා" භාග්‍යගෙ මව ඇසුවේය. ඔව් ඔව් අපේ නැති වෙච්ච දරුවාගේ හොඳම යාළුවා. ඒ දෙන්න එකම පන්තියේ ඉගෙන ගත්තේ" ඒකනායක මහත්මිය කීවාය. " හොඳ වෙලාවට මතක් කළේ මට චින්තලගෙ ගෙදර යන්න ඕන" භාග්‍යා කලබල විය. තිදෙනාම එහි යන විට චින්තා වෙරළු ගස යට වෙරළු ඇහිඳිමින් සිටියාය. " අනේ චින්තා උඹ ගොඩක් ලොකු වෙලා මහත් වෙලා චින්තා දුටු කුඩා භාග්‍යා කීවාය. චින්තාට දී තිබූ පොත් මිටියක්ම නැවත ලබා ගත් භාග්‍යා සවස ඒකනායක නිවසෙන් පිටත් වූවාය.

"අම්මා අම්මා ඉක්මනට එහා පැත්තට යමුකෝ අම්මාගේ අතින් අදිමින් භාග්‍යා කීවාය. "මොකද වදේ ළමයෝ දැන් බස් එකත් එයි මහනුවර සිට මැණික්හින්නට යෑමට ඔරලෝසු කණුව අසල පාරේ සිටි මව කීවාය. භාග්‍යාගේ පෙරැත්තයට පාරෙන් එහා පැත්තට මාරු වුණ පසු "අම්මා අන්න අර ළමයට කියන්නකො අර දාගෙන ඉන්න කණ්ණාඩිය ගලවන්න කියලී භාග්‍යා අම්මාට කීවාය. "පිස්සුද ළමයෝ මට පුළුවන්ද හඳුනන්නෙ නැති අයගේ කණ්ණාඩි ගලවන්න." මව කී විට ඇයම ගොස් එතැන සිටි තරුණ ළමයෙකුට උපැස් යුවළ ගලවන ලෙස කීවාය. ඔහු උපැස් යුවල ගැලවූ පසු "ආ මල්ලි දැන් එහෙනං කණ්ණාඩිත් දානව හොඳා හොඳා" යැයි භාග්‍යා කීවාය. නිවසේ වුණ සිද්ධිය අසා තිබූ ජයධම්මික මේ තමාගේ මියගිය අක්කා වන චම්පිකා විය යුතු යැයි තීරණය කළේය. එදා වයස අවුරුදු පහක පමණ දැරියක වූ භාග්‍යා මල්ලී යනුවෙන් ආමන්ත්‍රණය කළේ එදා වෛද්‍ය ශිෂ්‍යයකු වූ ජයධම්මිකටය. අද වසර විසිඅටක් පමණ වන භාග්‍යා තවමත් එසේ ආමන්ත්‍රණය කරන්නේ පැරණි මතක නිසා නොව පුරුද්දටය. ඉහත පුවත් තුන සඳහා

33 වන පිටට